## 222 කුඩා දරුවකු සේ

කුඩා දරුවකු සේ නොවේ නම්
සග සුව සැප ඔබ හට හිමි නැ //

පොඩි දරුවකු මෙන් පිවිතුරු වන්නේ
ඉසිකෝ මානය දුරලන්නේ
බැහැපත් මුදු ගුණයෙන් සැරසෙන්නේ
නිරතුරු ජය ගන්නේ

මා වෙනුවෙන් පොඩි උන් පිළිගන්නා
සැබවින් මාවයි පිළිගන්නේ
එලෙසින් මා පිළිගන්න තැනැත්තේ
ම පියා පිළිගන්නේ

මා අදහන මෙ නොකැළැල් දරුවන්
නොමගට යොමු කරනා අයගේ
ගෙලේ ගලක් බැඳ මහා මුහුද මැද
හෙළා දමනු වටනෙ

නායක වන්නට කැමැති තැනැත්තේ
පළමුව සේවකයකු වේවා
මූලික වන්නට පතන තැනැත්තේ
අන්තිමයා වේවා

"දරුවන් මා වෙත එන්නට ඉඩ දෙව්
ඔවුන් ගමන බාධා නොකරව්"
සගයේ උරුමය ඔවුන්'න වන බව
කිතු සමිඳෝ පැවසූ